පිළියන්දල අධ්‍යාපන කලාපය
**Education Zone - Piliyandala**

වර්ෂ මැද ඇගයීම - 2017
**Mid Year Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade } 10 | විෂයය Subject } බුද්ධ ධර්මය | පත්‍රය Paper } I | කාලය Time } පැය 01යි |

නම ..............................................                විභාග අංකය .....................

සැළකිය යුතුයි:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටස සඳහා ලකුණු 40කි.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දි ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- සැපයෙන පිළිතුරු පත්‍රයේ පිටු පස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

01) **සිදුහත් බෝසතාණන් වහන්සේ සතර පෙර නිමිති දැකීමෙන් ජීවිත යථාර්ථය ලෙස තේරුම් ගත් ජරා, ව්‍යාධි, මරණ යන කරුණු පිළිවෙළින්,**

1. ලෙඩවීම, වයසට යාම සහ මියයාම වේ.
2. මියයාම, ලෙඩවීම සහ වයසටයාම වේ.
3. වයසට යාම, ලෙඩ වීම සහ මියයාම වේ.
4. වයසට යාම, මිය යාම සහ ලෙඩ වීම වේ.

02) **සිදුහත් තවුසාණෝ හය මසක් දුෂ්කර ක්‍රියා කිරීම,**

1. බුදු වීමට පෙරුම් පිරීමකි.
2. කාමසුඛල්ලිකානු යෝගය අනුගමනය කිරීමකි.
3. අත්තකිලමථානුයෝගය අනුගමනය කිරීමකි.
4. පස්වග තවුසන්ගේ උදව් ගැනීම සඳහා කටයුතු කිරීමකි.

03) **ආගන්තුකයන් සඳහා පිළියෙල කළ ආහාරය වුවද පිළිගැන්වීම සුදුසු වන බැවින් භික්ෂූන් වහන්සේලා,**

1. " ඤායපටිපන්න " නමින් හැඳින්වේ.
2. කරුණා ගුණය නමින් හැඳින්වේ.
3. " ආහුණෙය්‍ය " නමින් හැඳින්වේ.
4. " පාහුණෙය්‍ය " නමින් හැඳින්වේ.

04) **පාසලේ ක්‍රීඩා තරඟයකින් තම පිලේ පරාජය විඳ දරා ගැනීමට නොහැකිව කම්පාවන ශිෂ්‍යයෙකුට වැඩියෙන් ප්‍රගුණ කරවිය යුත්තේ,**

1. මෛත්‍රී ගුණයයි.    2. කරුණා ගුණයයි.
3. මුදිතා ගුණයයි.    4. උපේක්ෂා ගුණයයි.

pdfelement

05) ප්‍රථම ද්වේවාචික සරණ ගිය උපාසකවරු නම්,

1. පස්වග තවුසන් ය. 2. තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් ය.
3. තුන් බෑ ජටිල පිරිස ය. 4. යසකුල පුත්‍රයා ඇතුලු පිරිස ය.

06) අයමන්ති මා ජාති නත්ථිදනි පුනබ්භවෝ ............... යන්නෙහි අදහස වනයේ,

1. මේ මාගේ අන්තිම උපතයි. නැවත උපතක් නැත.
2. මාගේ උපත ලෝක සත්වයාගේ විමුක්තිය උදෙසා ය.
3. මාගේ උපතින් ලෝක සත්ත්වයෝ විමුක්තියට පත් වේවා !
4. බුදුවී මිස මම මෙතැනින් නොනැගිටිමි

07) ලාභ-අලාභ, යස-අයස, නින්දා-ප්‍රශංසා යනාදියට ජීවිතයේදි මුහුණ දීමට සිදුවන අතර, ඒවාට නොසැලී ඔරොත්තු දීමට අවශ්‍ය මානසික ශක්තිය ඇතිකරගත යුතුය. ජීවිතයේදී මුහුණ දීමට සිදුවන එම ධර්මතා හැඳින්වනුයේ,

1. අට මහා සාවද්‍ය නමින් ය.
2. අටලෝ දහම නමින් ය.
3. ලෝක පාලක ධර්ම නමින් ය.
4. අටමහා කුසල නමින් ය.

08) චරථ භික්ඛවේ චාරිකං, බහුජන හිතාය බහුජන සුඛාය යනුවෙන් දේශනා කළේ,

1. අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාට ය.
2. භද්දවග්ගිය කුමාරවරුන් තිස්දෙනාට ය.
3. ප්‍රථම රහතන් වහන්සේලා හැටනමට ය.
4. අස්සජි මහා රහතන් වහන්සේ ඇතුළු භික්ෂු පිරිසට ය.

09) වන්දාමි චේතියං සබ්බං යන ගාථාවෙන් වන්දනා කරනු ලබන්නේ,

1. බොධීන් වහන්සේ ය. 2. වෙහෙර වහන්සේ ය.
3. බුදුන් වහන්සේ ය. 4. ත්‍රිවිධ චෛත්‍යයන් ය.

pdfelement

10) මුල, මැද, අග යන තුන් තැන්හි මැනවින් දේශනා කරන ලද නිසා ධර්මය,

1. ස්වාක්ඛාත නම් වේ.
2. සන්දිට්ඨික නම් වේ.
3. ඒහිපස්සික නම් වේ.
4. ඕපනයික නම් වේ.

11) අතැඹුලක් සේ ලොව සියල්ල ඇති සැටියෙන් දැනගත් හෙයින් බුදුරජාණන් වහන්සේ සතු ගුණය හඳුන්වන්නේ,

1. භගවා ගුණය නමිනි. 2. සුගත ගුණය නමිනි.
3. ලෝක විදූ ගුණය නමින් ය. 4. සත්ථා ගුණය නමින් ය.

12) සමථ භාවනාව වැඩීමෙන් ලබාගත නොහැකි ප්‍රතිඵලය වන්නේ ,

1. නිවන් දැකීම ය. 2. ධ්‍යාන ලබා ගැනීම ය.
3. සිත සමාධි කර ගැනීම ය. 4. චංචල සිත නිශ්චල කර ගැනීම ය.

13) බොර දියෙහි කිසිවක් නොපෙනේ. එමෙන්ම විවිධ කරුණු සම්බන්ධයෙන් සිතෙහි සැකයන් පවතී නම් මතකයට බාධා ඇති වේ. මෙම නීවරණ ධර්මය හැඳින්වෙනුයේ,

1. ථිනමිද්ධ නමිනි. 2. විචිකිච්ඡා නමිනි.
3. කාමච්ඡන්ද නමිනි. 4. ව්‍යාපාද නමිනි.

14) සීලයෙන් යුතුව සමාධි භාවනාව සඳහා යොමුවීමේදී පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංගයකි,

1. ශ්‍රද්ධාව 2. ඉන්ද්‍රිය සංවරය
3. ධම්මානුපස්සනාව 4. හිරි ඔත්තප්පය

15) ඇත්ත ඇති සැටියෙන් දකින නුවණ බුදු දහමෙහි හඳුන්වා ඇත්තේ ,

1. විපස්සනාවයි.
2. සමාධියයි.
3. විඤ්ඤාණයයි.
4. ප්‍රඥාවයි.

16) උට්ඨානවතෝ සතිමතෝ ............ යනාදි ධම්මපද ගාථාවට අනුව දියුණු වන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංග 7ක් ගැන කියවේ. එහි නිසම්මකාරිනො යනුවෙන් දැක්වෙන්නේ,

1. උත්සහවන්තවීමයි. 2. නිවැරදි සිහියයි.
3. විමසා බලා කටයුතු කිරීමයි. 4. දැහැමි දිවි පෙවෙතයි.

17) අසරණ සරණ සිරිසරණංකර හිමියන් විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයක් නොවන්නේ,

1. මුණිගුණාලංකාරයයි. 2. සාරාර්ථ සංග්‍රහයයි.
3. පාරමිතා ප්‍රකරණයයි. 4. සතර බණවර සන්නයයි.

18) තමා විසින් සිදු කරන ලද සියලු යහපත් ක්‍රියා පින් පොතෙහි සටහන් කළ දුටුගැමුණු රජතුමා විසින් වෙසක් උත්සව,

1. 24 ක් පවත්වන ලදී. 2. 18 ක් පවත්වන ලදී.
3. 22 ක් පවත්වන ලදී. 4. 28 ක් පවත්වන ලදී.

19) දෙමව්පියෝ ආහුණෙය්‍ය නාම වෙති. එයින් දැක්වෙන්නේ,

1. දෙමව්පියන් පූර්වාචාර්යවරුන් වන නිසා ය.
2. දරුවන් විසින් පිදීමට සුදුසු වන නිසා ය.
3. දරුවන් පෝෂණය කරන නිසා ය.
4. දරුවන්ට හොඳින් ශිල්ප ලබා දෙන නිසා ය.

20) අප හා අප සතු සියලු දේ වෙනස් වීම නිසා මතු වන දුක් සහිත බවෙන් තොර වූ නොවෙනස් හරයක් හෝ ආත්මයක් නොමැති බව ත්‍රි ලක්ෂණයේ දැක්වේ. මෙය එහි පැහැදිලි කෙරෙන්නේ,

1. අනිත්‍ය ලක්ෂණය තුළිනි. 2. දුක්ඛ ලක්ෂණය තුළිනි.
3. අනාත්මක ලක්ෂණය තුළිනි. 4. මේ එකකින්වත් නොවේ.

21) තණ්හාව හේතුවෙන් මිනිසුන් එකිනෙකා හා සටන් කිරීමට පෙළඹීමෙන් ඇතිවන දුක් ස්වභාවය,

1. පුද්ගල දුක් ය. 2. සමාජ දුක් ය.
3. ව්‍යාධිය නිසා ඇතිවන දුක් ය. 4. වයස්ගත වීම නිසා ඇතිවන දුක් ය.

22) පද්මාකාර බුදු සිරිතෙන් පාසල් සිසුන් වන ඔබට ගත හැකි ආදර්ශය වන්නේ,

1. ප්‍රශ්නවලට හා ගැටළු වලට බියෙන් ඒවා මගහැරයාමයි.
2. ලොව පවතින සියලු දේ කෙරෙහි ඇලී ගැලී සිටීමයි.
3. ගැටුම් හා දූෂණ මැද ඒවායින් අපවිත්‍ර නොවී සිටීමයි.
4. හුදකලාව ජීවත් වීමය.

pdfelement

23) සුසුඛං වත ජීවාම - වෙරිනෙසු අවේරිනො යන ගාථාවේ අර්ථය වන්නේ,

1. ජීවිතයක් යහපත් වීමට නම් නොමනා නොවටිනා දේ බැහැර කළ යුතුය
2. නැඟී සිටීමේ වීර්‍යයෙන් යුක්ත විය යුතුය
3. වෛර කරන මිනිසුන් අතර අපි වෛර නොකර සුවසේ වෙසෙමු
4. පුද්ගල ජීවිතයකට යහපත් ආශ්‍රය බෙහෙවින් වැදගත් වෙයි

24) අභිධ්‍යාව යන්නෙන් අදහස් කරනුයේ,

1. විද්‍යාව නොදන්නා කමයි
2. සියල්ල දත් බවයි
3. කිසිවක් නොදත් බවයි
4. දැඩි ලෝභයයි

25) බුදු දහමෙහි දැක්වෙන සතර සංග්‍රහ වස්තු නිවැරදිව ඇතුළත් වරණය තෝරන්න,

1. දානය, ධර්මය, අර්ථචර්යා, සමානාත්මතාවය
2. දානය, ප්‍රියවචන, අර්ථචර්යාව, සමානාත්මතාවය
3. දානය, ශීලය, භාවනාව, ප්‍රිය වචනය
4. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම හා අර්ථ චර්යාව

26) බුදු දහම අනුව කර්මය ඉගැන්වීමේ මූලික අරමුණ කුමක්දැයි ගුරුතුමා ඇසූ පැනයට තාලිකා දුන් පිළිතුර වූයේ,

1. සමාජ සාරධර්මය රැක ගැනීමට කර්මය මුල්වන බවයි.
2. කර්මය නමින් ජ්‍යෝෂ්‍ය ඉගැන්වීමක් බුදු දහමේ ඇති බව පැහැදිලි කිරීමට කර්මය උගන්වන බවයි.
3. විභාගයේදී අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමට කර්මය උගන්වන බවයි
4. අපගේ ක්‍රියා පිළිබඳව අපට ඇති වගකීම අවබෝධ කොට දී අප කරන ක්‍රියා සුමඟට යොමු කිරීමටය

27) බුදුරජාණන් වහන්සේ විසින් දේශිත පටිච්ච සමුප්පාදයෙන් තහවුරු කරන්නේ,

1. සසර දුකට හේතු සොයා ඒවා නැති කිරීමෙන් සැප උදා කරගත හැකි බව ය
2. සසර දුක හේතුවක් ඇතිවීම නිසා නැතිවන බව ය
3. සත්ත්වයා නැවත නැවත උපත ලබමින් මියෙන බව ය
4. සත්ත්වයා අතොරක් නැතිව සසර සැරිසරන බව ය

28) බුදුරජාණන් වහන්සේගේ ධර්ම ප්‍රචාරක කටයුතුවලදී වඩාත් අභියෝගාත්මක අවස්ථාවක් වූයේ,

1. පස්වග මහණුන්ට දහම් දෙසීමයි
2. යසකුල පුත්‍රයා ඇතුලු පිරිසට දම් දෙසීමයි
3. භද්දවග්ගිය කුමරුන්ට දම් දෙසීමයි
4. තුන් බෑ ජටිලයන්ට දම් දෙසීමයි

29) ඉපදීම නැතිවීමෙන් වයසට යාම, මරණය, ශෝකය පරිදේවය, දුක් දොම්නස්, උපායාස සියල්ල නැති වේ. මෙය ප්‍රකාශ වන්නේ,

1. භව නිරෝධා ජාති නිරෝධො
2. උපාදාන නිරෝධා භව නිරෝධො
3. ජාති නිරෝධා ජරා මරණ ශෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසා නිරුජ්ඣන්ති
4. උපාදාන නිරෝධා භව නිරෝධෝ



pdfelement

30) **තමන් උපන් මව්බිමට වැඩම කළ පළමු වතාවේ ශාක්‍යයන් විසින් බුදුරජාණන් වහන්සේට ඉදිකොට පූජා කරන ලද ආරාමය වනුයේ,**

1. පූර්වාරාමයයි
2. නිග්‍රෝධාරාමයයි
3. ඉසිපතනාරාමයයි
4. ජේතවනාරාමයයි

31) **පැවිද්දකු සිවුපසය ලබා ගැනීම සඳහා නැති ගුණ නොපෙන්වීම, ගිහියෙකු තමා කරන රැකියාව නිවැරදිව හා අවංකව කිරීම වෙළඳාමේදී වංචනික නොවීම අයත් වන්නේ,**

1. සම්මා සංකප්පයට ය
2. සම්මා වායාමයට ය
3. සම්මා කම්මන්තයට ය
4. සම්මා ආජීවයට ය

32) **තුන්වන භවයේ සිට ඉඩ ලැබෙන ඕනෑම විටක විපාක දෙන කර්ම, නිවන් ලැබෙනා තුරු හා නිවන් ලැබීමෙන් පසු පිරිනිවන් පාන මොහොත දක්වාම විපාක දිය හැකිය. මෙම කර්ම,**

1. දිට්ඨධම්මවේදනීය කර්ම වේ
2. අපරාපරිය වේදනීය කර්ම වේ
3. අහෝසි කර්ම වේ
4. උපපජ්ජ වේදනීය කර්ම වේ

33) **උතුම්ම ලාභය ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ,**

1. වැඩිපුර මුදල් ඉපයීම ය
2. නිරෝගිව ජීවත් වීම ය
3. සතුටින් ජීවත් වීම ය
4. අඩුවෙන් මිළට ගෙන වැඩි මිළට විකිණීම ය

34) **සල්ලේඛ ප්‍රතිපදාව යන්නෙන් අදහස් කරන්නේ,**

1. සෙසු ලෝකය දස අකුසල් කරමින් සිටියද අප එයින් වැළකෙමු යන ප්‍රතිපදාවයි
2. අනුන්ටත් තමන්ටත් වැඩි වැඩක් නොවන ආකාරයට ජීවිතය ගෙන යන ප්‍රතිපදාවයි
3. විවිධ දුසිරිත්වල යෙදෙමින් තමන් යහපත් කෙනෙකු බව පෙන්වමින් ජීවිතය ගෙන යන ප්‍රතිපදාවයි
4. දස අකුසල කර්මයන්හි යෙදෙමින් පාපකාරී ජීවිතයක් ගත කරමි යන ප්‍රතිපදාවයි

35) **බුද්ධත්වයෙන් පසු බුදුරජාණන් වහන්සේ දෙවනි සතිය ගත කළේ,**

1. අජපාල නුගරුක මුල වැඩ සිටීමෙනි
2. කිරිපලු නුගරුක මුල වැඩ සිටීමෙනි
3. අනිමිසලෝචන පූජාවේ යෙදීමෙනි
4. රුවන් සක්මනේ යෙදීමෙනි

36) **මා තරුණ වියේ පිළිවෙත් රැක්කේ නැත, ධනය රැස් කළේද නැත. දැන් මහලු වූයෙමි. ඒ කිසිවක් කරගන්නට ශක්තියක් නැත්තේ වෙමි. මෙසේ සිතන පුද්ගලයා උපමා කළ හැක්කේ,**

1. තරුණ දුනුවායාට ය
2. මහලු කොස්වා ලිහිණියාට ය
3. විලෙහි සිටි මාළුවාට ය
4. කුම්භඝෝෂකට ය

pdfelement

37) **බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය ආදර්ශයට ගත් ශිෂ්‍යයෙකු තුළ තිබිය හැකි ගුණාංගයක් වන්නේ,**

1. විනය කඩකරන සිසුන්ට දඬුවම් කිරීමයි
2. විනය කඩකරන සිසුන් මඟහැර සිටීමයි
3. විනය කඩ කරන සිසුන්ට එරෙහි ව උද්ඝෝෂණය කිරීමයි
4. විනය කඩ කරන සිසුන් අතර විනයගරුකව කටයුතු කිරීමයි

38) **ස්වාමිනි ඔබ වහන්සේ දෙවි කෙනෙක්ද, ගාන්ධර්වයෙක්ද, යක්ෂයෙක්ද, නැතහොත් මනුෂ්‍යයෙක්ද, යනුවෙන් ප්‍රශ්න කරන ලද්දේ,**

1. උපාලි ගෘහපතියා විසිනි
2. අම්බට්ඨ මානවකයා විසිනි
3. ද්‍රෝණ බමුණා විසිනි
4. භද්දවග්ගිය කුමාරවරුන් විසිනි

39) **ජනක කර්මයෙන් කෙරෙන කෘත්‍ය,**

1. ජීවිතයට බාධා කිරීමයි.
2. ලැබූ ප්‍රතිසන්ධිය පවත්වා ගෙන යාමට රුකුල් දීමයි.
3. යම් තැනක ප්‍රතිසන්ධිය ලබා දීමයි
4. ජීවත්වීමේ ශක්තිය සම්පූර්ණයෙන් නැතිකර දැමීමයි

40) **පටිච්ච සමුප්පාදයේ ඵස්ස යනුවෙන් හඳුන්වන්නේ,**

1. ඇස, කණ ආදී ඉන්ද්‍රියන් ය
2. ඉන්ද්‍රිය අරමුණ හා විඤ්ඤාණය එක්වීම ය
3. ප්‍රතිසන්ධි සිත ය
4. රූප, ශබ්ද, ගන්ධ, රස ස්පර්ශ ආදී අරමුණු ය

pdfelement

පිළියන්දල අධ්‍යාපන කලාපය

**Education Zone - Piliyandala**

වර්ෂ මැද ඇගයීම - 2017

**Mid Year Evaluation**

| ශ්‍රේණිය Grade | 10 | විෂයය Subject | බුද්ධ ධර්මය | පත්‍රය Paper | II | කාලය Time | පැය 02යි |
|---|---|---|---|---|---|---|---|

නම .................................................. විභාග අංකය .......................

සැළකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.
  ( පිළිතුරු සැපයිය යුතු සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව 05 කි. )

01) i . ධර්ම විවරණවල දැක්වෙන පරිදි තුන් ආකාර වූ සසර දුකෙන් දෙකක් නම් කරන්න.

ii . ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති යන පාඨයේ අදහස ලියන්න.

iii . රූපය පෙණ පිඩක් වැනිය. වේදනාව දිය බුබුලක් වැනිය. එසේ නම් සඤ්ඤාව කුමක් වැනිද?

iv . ජනක කර්මයට බාධා පමුණුවන එහි බලය හීන කරවන කර්මය කුමක්ද?

v . සිඟාලෝවාද සූත්‍රයට අනුව බටහිර දිශාවට සහ දකුණු දිශාවට සමාන කර ඇති සමාජ කණ්ඩායම් දෙක නම් කරන්න

vi . සීලයේ ආනිසංස 02ක් ලියන්න

vii . යථාභූතඥාන දස්සනය යනු කුමක්ද?

viii . බෞද්ධයෙකු වීමේ පළමු පියවර කුමක්ද?

ix . දහම් ගුණ අතරින් ඕපනයික ගුණයත් සඟ ගුණ අතරින් ඤායපටිපන්න ගුණයත් කෙටියෙන් හඳුන්වන්න.

x . වැලිවිට අසරණ සරණ සිරි සරණංකර හිමි රචිත ග්‍රන්ථ 02ක් නම් කරන්න

02) i . ත්‍රිලක්ෂණය නම් කරන්න

ii . ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාව අනුව වෙන් කර ලියන්න

iii . අසීමිත ආශාවන් නිසා මිනිසුන් දුකට පත්වන ආකාරය ආර්ය අෂ්ටාංගික මාර්ගය ඇසුරින් පැහැදිලි කරන්න

03) i. බුදු දහමේ සඳහන් භාවනාව කී ආකාරද?

ii . පංච, නීවරණ ධර්ම නම්කර ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න

iii . භාවනාව ප්‍රගුණ කිරීමෙන් ශිෂ්‍ය ජීවිතයද සාර්ථක කරගත හැකි බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

pdfelement

04) i. සමවායෝ එව සාධු යන පාලි පාඨයේ අදහස කුමක්ද?

ii . අපේක්ෂාව යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

iii . අපේක්ෂාව සුරකිමින් සහජීවනයෙන් ක්‍රියා කළ යුතු ආකාරය බුදු දහම ඇසුරෙන් පැහැදිලි කරන්න.

05) i. ශ්‍රද්ධාවේ ප්‍රභේද නම් කරන්න

ii . දහම් ගුණ නම් කරන්න

iii . සිඟාලෝවාද සූත්‍රයට අනුව ගිහියා විසින් භික්ෂූන් වහන්සේලාට සංග්‍රහ කළ යුතු ආකාරය පැහැදිලි කරන්න

06) යේ ධම්මා හේතුප්පභවා

i. ඉහත ගාථාවෙන් ධර්ම දේශනා කළේ කවුරුන් විසින් කාහටද?

ii . එම ගාථාවේ අදහස ලියන්න

iii . සමාජ ගැටලු දෙකක් නම් කර ඒවා ඇතිවන ආකාරය සහ ඒවා විසඳාගතහැකි ආකාරය හේතුඵල ධර්මය ඇසුරෙන් පැහැදිලි කරන්න

07) **දී ඇති මාතෘකාවලින් දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න.**

i. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජහිමි

ii . සමථ භාවනාව

iii . ධම්ම පදයෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ

iv . දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා ආර්ය සත්‍යය

pdfelement